ආදරයෙන් ජීවිතය දෙස බලන්න...
යථාර්ථවාදීව ලෝකය දකින්න...
සැබෑවින් ම ජීවිතය විඳින්න...
සෞන්දර්යවාදීන්ගේ නවාතැන....



උසස් පෙළ සිංහල
නව විෂය නිර්දේශය
ADVANCED LEVEL SINHALA NEW SYLLABUS

ඔබ මෙහි ආවේ ඇයි...
ආවෙකු විලස යන්න ද?
නාවෙකු විලස යන්න ද?
සැමදා රැඳී සිටින්න ද?
රැඳී නොසිටින්න ද?
නොරැඳී රැඳී ඉන්න ද?
රැඳී නොරැඳී ඉන්න ද?
කිසිවක් රැගෙන යන්න ද?
කිසිවක් නබා යන්න ද?

සිංහල
නම්...
ආර්.නානායක්කාර
B.A.(Sin)sp.Hons
voice : +94713531085
email : sinhalanamrnanayakkara@gmail.com
පිට පිට දෙවඟාවක් ලංකාවේම තුන්වැනියා ඕගි කළ උසස් පෙළ සිංහල පාඨමාලාව

දැක්ම

දැනුම, කුසලතා, යහපත් ආකල්පවලින් හෙබි සහ
සෞඛ්‍ය සම්පන්න සාර්ථක දරු දැරියන් පිරිසක්
දැයට දායාද කිරීම.

පින්සාර හෙට දවස

නුඹ මෙළොව එළිය දුටු දා පටන් දෙමාපියන්ගේ සිත් තුළ වූ පරම පැතුම වූයේ නුඹ මේ සමාජයේ වැජඹෙන පුද්ගලයෙකු කිරීමට ය. දෙමව්පියන් තම ගත සිත සවි දිය කොට කැපවුනේ ඔබගේ ජයග්‍රහණයන් උදෙසා ය. අද ඔබ එම ජයග්‍රහණය අත්පත් කරගෙන ඇත. එකී ජයග්‍රහණය වෙනුවෙන් උණුසුම් සුබ පැතුම් එක් කරමි. ඔබට මින් ඉදිරියට ඇත්තේ තවත් විජයග්‍රහණයක් සොයා යාමට ය. එය විජයග්‍රහණයක් කිරීමට දිරිය ශක්තිය දීමටත් ඔබ උතුම් සාරධර්මවලින් පිරිපුන් නිර්මාණශීලී උත්තම මිනිසකු කිරීමටත් කැපවෙන්නෙමි. ඔබට මග පෙන්වන විට ඔබ එලෙසින් ක්‍රියා කළ යුතු ය. දෑ වසරක කැපවීම ඔබ ජීවිතය සුවිසල් ජයග්‍රහණයක් කරා කැටුව යනු ඇත. ඔබේ දෙමාපියන්ගේ සහෝදර සහෝදරියන්ගේ ගුරුවරුන්ගේ නෑදෑ හිත මිතුරන්ගේ පැතුම් ඉටුවනු ඇත. ඔබේ ජීවිතයම සාර්ථක එකක් වනු ඇත. එහෙයින් දෑ වසරක් උපරිමයෙන් කැපවන්නට අදිටන් කර ගන්න. නිවැරදිමග පෙන්වීමත් උපරිම උත්සාහයත් තුළ ඔබේ ජීවිතයේ රන් දොරටුව විවර වනු ඇත.

"ඇල්මෙන් ඇවිදින්
අකුරු ඇහිදගෙන
කඳු මුදුනට නැග බලන්න
ජීවිතයේ උස"

<u>ආ මග කෙටියි යා යුතු මග දුරයි</u>

ඔබ උසස් පෙළ කලා විෂය ධාරාව හැදෑරීමට ගත් බුද්ධිමත් තීරණය අගේ කරමි. මන්ද විශ්වවිද්‍යාලයට යාමට පහසුම මග මෙයයි. එමෙන් ම ලොව ශ්‍රේෂ්ඨතම පුරවැසියන් බිහිව ඇත්තේ කලා උපාධිධරයන් ය. ලංකාවේ මෑත කාලයේ බිහි වූ බොහෝ ජනාධිපතිවරු කලා උපාධිධරයෝ ය. ලොව වැඩිම ශ්‍රේෂ්ඨ දේශපාලන නායකයෝ වෘත්තියෙන් නීතීඥයෝ ය. ලොව සදාතනික ජීවත්වන චරිත කලා කරුවෝ ය. කවීන් ගීත රචකයින් නවකතාකරුවන් කෙටිකතාකරුවන් විචාරකයින් වැනි ලොවක් නලවන චරිත බිහි වන්නේ කලා විෂය ධාරාවෙනි. ඔබත් එවන් ශ්‍රේෂ්ඨ මිනිසකු වන්නට අදිටන් කර ගන්න. මිහිකත පවතින තුරු ඔබේ නම අමරණීය වනු ඇත.

උසස් පෙළ සිංහල විෂය හැදෑරීමෙන් ඔබට ලබා ගත හැකි වෘත්තීන් හැදෑරිය හැකි පාඨමාලා ආදිය විමසා බැලුවහොත් ඔබට ඉදිරි ජීවිත සැලසුම් සකස්කර ගැනීමට මහෝපකාරී වනු ඇත.

නීතීඥ වෘත්තිය

ඔබ කලා විෂය ධාරාව හදාර ඉහළ ප්‍රතිඵලයක් ලබා දිස්ත්‍රික්කයේ මුල් කුසලතා අතරට පත් වුවහොත් පෙරදා අපේ සිංහල පන්තියේ උසස් පෙළ මාතර දිස්ත්‍රික් කුසලතා 25 මධුවන්ති රුබසිංහ දැන් ඕස්ට්‍රේලියාවේ නීතීඥ වරියකි. එදා ලංකාවෙන් තුන්වැනියා වූ රජිත ලක්ෂාන් අබේවර්ධන අද ලංකාවේ ඉහළ පෙලේ නීතීඥවරියකි. ඔබට ද ගෞරවණීය නීතීඥ වෘත්තියට ප්‍රවිෂ්ට විය හැකි ය. ලොව ඉහළම ආදායම් ලබන ඉහළම පිළිගැනීමක් ඇති වෘත්තියක් ලෙස නීතීඥ වෘත්තිය හඳුනාගත හැකි බව ඔබට අමුතුවෙන් කිව යුතු නොවේ. මේ සඳහා ඔබ සපුරාලිය යුතු සුදුසුකම් කිහිපයකි. ඒ අතරට අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී අනෙකුත් විෂයන් සමඟ ඉංග්‍රීසි විෂයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ උසස් පෙළ Genaral English විෂයට S සාමාර්ථයක් ලබා සිටිය යුතුම ය. ඊට අමතරව උසස් පෙළ ඔබ තෝරා ගත් විෂයන් අතර සෞන්දර්ය විෂයක් (චිත්‍ර, නැටුම්, සංගීතය, නාට්‍ය හා රංගකලාව, ගෘහ ආර්ථික විද්‍යාව) නොතිබිය යුතු ය. නීති විද්‍යාලයට ඇතුළත් වීමට උසස් පෙළට තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය (Logic) යන විෂය හැදෑරීමට අවශ්‍ය නොවේ.

පරිපාලන සේවය (දිසාපති ඇතුළු තවත් ක්ෂේත්‍ර)

ඔබට පරිපලන නිළධාරියකු වීමට අවශ්‍ය නම් ඒ සඳහා වන තරඟ විභාගයෙන් සමත්විය යුතු ය. එම විභාගයට ඉදිරිපත් වීමට නම් උපාධියක් තිබිය යුතු ය. මෙම විභාගයේ දී කලා උපාධිධරයන්ට සුවිශේෂී වරප්‍රසාදයක් හිමිවන්නේ ප්‍රශ්න පත්‍රයේ බොහෝ ප්‍රශ්න කලා විෂය ධාරාවට බර වීමයි. සිංහල භාෂාව සඳහා වෙනම ම ප්‍රශ්න පත්‍රයක් ඇත. ප්‍රදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් (දිසාපති) තනතුරු යනු ලංකාවේ ඉහළම වැටුප් හා ඉහළම පිළිගැනීමක් ඇති වෘත්තියකි. එමෙන් ම අමාත්‍යංශ ලේකම්, විදේශ තානාපති ආදි තනතුරු දක්වා උසස් වන්නේ ද පරිපාලන නිළධාරීන් ය. අධ්‍යාපන පරිපාලන සේවය ද මෙසේ ය. පෙරදා අපගේ පන්තියේ දිස්ත්‍රික් ප්‍රථමයා වූ නුවන් තරංග අබේවික්‍රම අද සහකාර ප්‍රාදේශීය ලේකම්වරයෙකි.

මහාචාර්ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය හා ගුරු වෘත්තිය

විශ්වවිද්‍යාලයට ඇතුළු වී උපාධිය හදාරා ඉහළම ලකුණු සහිතව උපාධිය නිමා කළහෝත් (ප්‍රථම පන්ති හෝ දෙවන පෙළ) ඔබට එම විශ්වවිද්‍යාලයේ හෝ වෙනත් විශ්ව විද්‍යාලයක සහය කථිකාචාර්යවරයකු වී කථිකාචාර්ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා මහාචාර්ය වැනි තත්වයන්ට පත්විය හැකි ය. අපගේ පන්තියේ සිංහල විෂය හැදෑරූ පවිත්‍රා ගමගේ දැන් රුහුණු විශ්වවිද්‍යලෙයේ සිංහල අධ්‍යන අංශයේ කථිකාචාර්යවරියකි. ආර්. සමින්ද දේශාන් දැන් කොරියානු විශ්වවිද්‍යාලයක මහාචාර්යවරයෙකි. (Namseoul University Collage Of General Education Assistant Professor Masters In Korean Language And Literature)

ශ්‍රී ලංකා ගුරු සේවය

පාසල් පද්ධතිය තුළ ගුරු සේවයට ප්‍රවිෂ්ට වීමට ද ඔබට වරප්‍රසාද හිමි වේ. මෙහිදී අවස්ථා දෙකක් ඇත. පළමුවැන්න විශ්වවිද්‍යාල උපාධිය ලබා පසුව ගුරු සේවයට ඇතුළත් වීමයි.

දෙවැනි ක්‍රමය උසස් පෙළින් විශ්වවිද්‍යාලයට තෝරා පත්වීමට ලකුණු ප්‍රමාණවත් නොවුනහොත් ඊළඟ දිස්ත්‍රික් කුසලතා සලකා බලා විද්‍යාපීඨවලට ඇතුළත් කර ගනු ලැබේ. මෙමගින් ද ගුරු සේවයට ප්‍රවිෂ්ට විය හැක. මෙහිදී උසස් පෙළ කලා විෂය ධාරාවෙන් විද්‍යා පීඨවලට ඇතුළත් වීමේ දී වැඩිම පාඨමාලාවන් ඇත්තේ උසස් පෙළ සිංහල විෂය හැදෑරූ අයට පමණි.

සෞන්දර්ය

සෞන්දර්ය විෂයන් වන චිත්‍ර නැටුම් සංගීතය නාට්‍ය හා රංගකලාව යන විෂයන්ගෙන් එකක් හදාරා ඇත්නම් සෞන්දර්ය විශ්වවිද්‍යාලයට ඇතුළු විය හැක. එවිට සෞන්දර්ය උපාධිය ලබා විවිධ වෘත්තීන්ට ප්‍රවිශ්ට විය හැක. මෙහිදී සිංහල විෂය හදාරා ඇත්නම් බොහෝ වරප්‍රසාද හිමි වේ. (උසස් පෙළ 2009 සරසවි උෆරුබොක්ක - චානක සම්පත් විභාග අංක 1877631 එවන් සිසුවෙකි. ඔහුගේ දිස්ත්‍රික් කුසලතාව 385 - මාතර. දැන් ඔහු සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකි.)

ඉංජිනේරු

මොරටුව විශ්වවිද්‍යාලයේ පවත්වනු ලබන ඉංජිනේරු පාඨමාලාව සීමිත සිසු පිරිසක් ඇතුළත් කරගනු ලැබෙති. එවිට ඉංජිනේරු උපාධිය හදාරා විවිධ වෘත්තීන්ට ප්‍රවිෂ්ට විය හැකි ය. (සිප්සිටි දෙණියාය - ශශිකා රංගනී කුමාරගේ ශිෂ්‍යාව, ජයබිම-වලස්මුල්ල සුරාජ් මධුෂාන් රාමනායක, හම්බන්තොට දිස්ත්‍රික් කුසලතා අංක 2 ලබා එම උපාධිය හැදෑරූහ)

තරඟ විභාග

ලංකාවේ පවත්වන රෙජිස්ට්‍රාරි ජනරාල්, MSO, ග්‍රාම නිලධාරි, අධ්‍යාපන පරිපාලන රාජ්‍ය පරිපාලන, විදුහල්පති, ගුරු විභාග ආදී බොහොමයක් තරඟ විභාගවලදී වැඩිම වරප්‍රසාද හිමි වන්නේ උසස් පෙළ සිංහල විෂය හැදෑරූ සිසුන්ට ය. මන්ද මෙම විභාගවල වැඩිම ප්‍රශ්න ප්‍රමාණයක් සැකසෙන්නේ සිංහල විෂය ආවරණය කරමිනි. එබැවින් තරඟ විභාගයකින් වෘත්තියට ප්‍රවිශ්ට වේ නම් ඊට පිහිට ද සිංහල විෂය බව මතක තබා ගන්න.

වෙනත් වෘත්තීන්

ඔබ විශ්වවිද්‍යාලයෙන් ගෞරව හෝ සාමාන්‍ය උපාධියක් ලබාගත හොත් තවත් බොහෝ වෘත්තීන්වලට ප්‍රවිශ්ට වීමට ඉඩ ප්‍රස්ථාව හිමිවේ. ඔබට ද මෙවන් වෘත්තිකයන් අතරට ප්‍රවිෂ්ට විය හැක. ඊට අදිටන් කර ගන්න. එමෙන් ම මනුෂ්‍යත්වය හඳුනන උත්තරීතර මිනිසකු වීමට ද අදිටන් කර ගන්න. එවන් ඉලක්ක කරා ළඟා වීමට මාගේ මග පෙන්වීම නොමදව ලබා දීමට කැපවන අතර ඔබ ද උපරිමයෙන් කැප විය යුතු ය. එහෙයින් අඛණ්ඩව පන්තිවලට සහභාගී වීමටත් සියලු පාඩම් හොඳින් අවබෝධ කර ගැනීමටත් විභාග පෙරහුරු පරීක්ෂණවලට පෙනී සිටීමටත් පවරන අභ්‍යාස කිරීමටත් පෙන්වා දෙන අඩුපාඩු සකස් කර ගැනීමටත් වග බලා ගන්න. ජයග්‍රහණය ඔබ සොයා එනු ඇත.

(සැ.යු මෙම ලිපිය සකස් කිරීමේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය යන කෘතිය මූලාශ්‍රය කරගෙන ඇත. වැඩි විස්තර සඳහා එම කෘතිය කියවන්න.)

කලා විෂය ධාරාව හදාරන ඔබට පිවිසිය හැකි අභිමානවත් වෘත්තීන් කිහිපයක්..

- ශ්‍රේෂ්ඨාධිකරණ අග්‍ර විනිශ්චයකාරවරයා
- ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු
- අභියාචනාධිකරණ විනිසුරු
- මහා අධිකරණ විනිසුරු
- දිසා අධිකරණ විනිසුරු
- මහේස්ත්‍රාත් අධිකරණ විනිසුරු
- නීතිඥ ව්‍යාපාරය
- අමාත්‍යාංශ ලේකම්
- දිස්ත්‍රික් ලේකම්
- පලාත් ලේකම්
- ප්‍රාදේශීය ලේකම්
- සහකාර ප්‍රාදේශීය ලේකම්
- විදේශ සේවා නිලධාරී
- ආපදා සහන සේවා නිලධාරී
- අපනයන සංවර්ධන නිලධාරී
- කර්මාන්ත සංවර්ධන නිලධාරී
- ඵලදායිතා නිලධාරී
- ජන සංඛ්‍යා ලේඛන නිලධාරී
- බන්ධනාගාර හා පුනරුත්ථාපන නිලධාරී
- බෞද්ධ කටයුතු නිලධාරී
- සංස්කෘතික නිලධාරී
- ග්‍රාම සංවර්ධන නිලධාරී
- නිපුණතා සංවර්ධන නිලධාරී
- මානව සම්පත් සංවර්ධන නිලධාරී
- මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්
- ළමා හිමිකම් සංවර්ධන නිලධාරීන්
- වනිතා සංවර්ධන නිලධාරීන්
- උපදේශන නිලධාරීන්
- සමාජ සේවා නිලධාරීන්
- කළමණාකාර සහකාර නිලධාරීන්
- ආර්ථික සංවර්ධන නිලධාරීන්
- සංවර්ධන නිලධාරීන්
- මාධ්‍ය අධ්‍යක්ෂක
- මුද්‍රල් අධ්‍යක්ෂක
- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක
- කලාප අධ්‍යාපන නිලධාරී
- විදුහල්පති
- නියෝජ්‍ය විදුහල්පති
- ගුරු සේවය
- ආරක්ෂක අංශයේ ඉහළ නිලධාරීන්

හැඳින්වීම

සිංහල භාෂාව ලෝකයේ ඇති සුබනම්‍ය ජීව භාෂාවලින් එකකි. වසර දහස් ගණනක් තිස්සේ ඉතිහාසයේ විවිධ කඩඉම් පසු කරමින් විකාශනය වූ සිංහල භාෂාව සාරගර්භ සාහිත්‍යයකට ද හිමිකම් කියයි. සිංහල භාෂාව වහරනුයේ ලෝක ජනගහනයට සාපේක්ෂ ව කුඩා පිරිසක් වුව ද සාරවත් බවින් හෙළ බස ලෝකයේ සෙසු කවර බසකට වුව දෙවැනි වෙති යි සිතිය නොහේ. වර්තමාන ශ්‍රී ලාංකේය පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මාධ්‍ය භාෂාව වන්නේ ද සිංහල භාෂාවයි. පාසල් අධ්‍යාපනයට පිවිසෙන ශිෂ්‍යයා සිංහල භාෂාව විධිමත් ලෙස හැදෑරීම ආරම්භ කරනුයේ පාසලේ පළමු ශ්‍රේණියේ පටන් ම ය. පාසලේ කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කරන අවස්ථාව වන විට ශිෂ්‍යයා ස්වකීය මවු භාෂාව පිළිබඳ යම් පරිචයක් අත් පත් කර ගෙන සිටී. සාමාන්‍ය පෙළ විභාගය සඳහා සූදානම් වන විට තවත් භාෂාත්මක හා සාමාන්‍ය දැනුම වර්ධනය කරගන්නා අතර උසස්පෙළ සිංහල විෂය ඊට වඩා පුළුල් පරාසයක් තුළ විහිදී යයි.

විෂය නිර්දේශය

<u>සාහිත්‍ය I කොටස</u>

1. නූතන පද්‍ය සංග්‍රහය (පද්‍ය පන්ති 25)
2. පුරාතන පද්‍ය සංග්‍රහය (ගුත්තිල කවි 254)
3. පුරාතන ගද්‍ය කතා 8 ක්

    - සද්ධර්මරත්නාවලිය - මට්ටකුණ්ඩලී, කුණ්ඩලකේෂී
    - ජාතක කතා - චන්නකිනන්ර, චුල්ලධනුද්දර
    - පූජාවලිය - ජීවක, අනුරුද්ධ
    - සද්ධර්මාලංකාරය - ස්වර්ණතිලකා, නන්දිවාණිජ

4. බැද්දේගම නවකතාව
5. කෙටිකතා සංග්‍රහය
6. පේමතෝ ජායති සෝකෝ නාට්‍ය

<u>ව්‍යාකරණ II කොටස</u>

1. අක්ෂර මාලාව හා වර්ගීකරණය
2. අක්ෂර වින්‍යාසය
3. පිල්ලම් හා අකාරාදි පිළිවෙළ
4. සන්ධි
5. සමාස
6. විභක්ති
7. පද වර්ග - නාම, ක්‍රියා, නිපාත, උපසර්ග
8. ප්‍රත්‍යාර්ථ නාම - තද්ධිත, කෘදන්ත
9. ප්‍රකෘති හා අනුරූප වචන (තත්සම, තත්භව, නිෂ්පන්න)
10. ලේඛන භාෂාව හා කථන භාෂාව
11. වාක්‍ය වින්‍යාසය
12. සාරාංශකරණය
13. රචනා

උසස් පෙළ සිංහල

12 ශ්‍රේණියේ වාර විභාගවලට සූදානම් වීමේදී
වාර තුනට අදාළ පාඩම් බෙදී ඇති අයුරු

පළමු වාරය

01. පුරාතන පද්‍ය සාහිත්‍යයෙහි ආරම්භය හා විකාශනය
02. කවිය හඳුනා ගැනීම, නූතන සිංහල කාව්‍යයෙහි ආරම්භය හා විකාශනය
03. නාට්‍ය සාහිත්‍යයෙහි විශේෂතා
04. පුරාතන ගද්‍ය සාහිත්‍යයෙහි ආරම්භය හා විකාශනය
05. නවකතාව නම් සාහිත්‍යයේ විශේෂතා
06. කෙටිකතාව හා කෙටිකතා මූලිකාංග හඳුනා ගැනීම
07. භාෂණය හා ලේඛනය අතර වෙනස හඳුනා ගැනීම
08. අක්ෂර මාලාව හැඳින්වීම සහ අක්ෂර වර්ගීකරණය
09. නාම හා නාම ප්‍රභේද
10. වාක්‍ය රචනය
11. විවිධ ලේඛන වර්ග හඳුනා ගැනීම 10

දෙවන වාරය

01. ගුත්තිල කාව්‍යයේ පසුබිම හඳුනා ගැනීම
02. නූතන සිංහල කාව්‍ය රස විඳීදනය හා විචාරය (සමනලයා, නැළැවිල්ල, කුකුළු හැවිල්ල, ලක්මවුනි මගේ, ඉගිලෙන සිහින)
03. සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය
04. පුරාතන ගද්‍ය - අර්ථාවබෝධය හා රස විඳීදනය (මට්ටකුණ්ඩලී වස්තුව හා අනුරුද්ධ කුමාර කථාව)
05. සිංහල නවකතාවේ ආරම්භය හා විකාශනය
06. සිංහල කෙටිකතාවේ ආරම්භය හා විකාශනය
07. අක්ෂර වින්‍යාසය
08. නිෂ්පන්න, තත්සම, තද්භව
09. සන්ධි විධි
10. ක්‍රියා හා ක්‍රියා ප්‍රභේද
11. අවබෝධය (අනිර්දිෂ්ට ගද්‍ය පාඨ)



තුන්වන වාරය

01. ගුත්තිල කාව්‍යය - රසවින්දනය හා විචාරය (91 - 147 කවි)

02. නූතන සිංහල කාව්‍ය රසවින්දනය හා විචාරය (අඩ සඳ, ළදරු හැඟුම්, දෙවියන් මැරීම, පැසුණු පැන)

03. නාට්‍ය ප්‍රවර්ග හඳුනා ගැනීම හා පේමතෝ ජායතී සෝකෝ නාට්‍යයේ පසුබිම හඳුනා ගැනීම

04. පුරාතන ගද්‍ය - අර්ථාවබෝධය හා රසාස්වාදය (චන්දකින්නර ජාතකය සහ ස්වර්ණතිලකා වස්තුව)

05. බැද්දේගම නවකතාවේ පසුබිම හඳුනා ගැනීම

06. කෙටිකතා රසවින්දනය හා විචාරය

වහල්ලු, වෙසක් පහන, දිසෞන්චිනා හාමි, නොනිමි සිත්තම්, නංගි, අකුරට යන වෙලාවේ ස්නේහය

07. නිපාත හා උපසර්ග

08. විශේෂණ පද

09. සමාස

10. ප්‍රත්‍යාර්ථ නාම (තද්ධිත නාම හා කෘදන්ත නාම)

11. උක්ත අනුක්ත භේදය (වාක්‍ය රීති)

12. සාරාංශකරණය

13 ශ්‍රේණියේ චාර තුනට පාඩම් බෙදී යන අයුරු

01 වාරය

01. ගුත්තිල කාව්‍යය (148 - 193 කවි)

02. නූතන කාව්‍ය - රසවින්දනය හා විචාරය (හෙළ හවුල් කවිය සහ නිදහස් කවියේ ප්‍රථම තරංගය)

03. පේමතෝ ජායතී සෝකෝ නාට්‍යය - රසවින්දනය හා විචාරය (පළමු සහ දෙවන අංක)

04. පුරාතන ගද්‍ය අර්ථාවබෝධය හා රසවින්දනය (චුල්ලධනුද්දර ජාතකය හා නන්දිවාණිජ වස්තුව)

05. බැද්දේගම (නවකතාව) - රසවින්දනය හා විචාරය (1 -5 පරිච්ඡේද)

06. කෙටිකතා රසවින්දනය හා විචාරය
- කපිතාන්ගේ පුත්තු - දයාසේන ගුණසිංහ
- මිනිස් වටය - එරික් ඉලයප්පආරච්චි
- කරත්තය - සෝමරත්න බාලසූරිය
- කළු සපත්තු - ජයතිලක කම්මැල්ලවීර

07. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධ රීති

08. වාක්‍ය රචනය

09. විශේෂාංග ලිපි රචනය

10. අවබෝධය (අනිර්දිෂ්ට ගද්‍ය පාඨ)

02 වාරය

01. ගුත්තිල කාව්‍යය (194 - 295 කවි)

02. නූතන පද්‍ය - රසවින්දනය හා විචාරය (නිදහස් කවියේ ද්විතීය තරංගය)
දේදුන්න පායාවි පාලම උඩින් හෙටත්, පොඩි දුව, රන්තැටියක කඳුළු, දුරු රට ගිය පුතු, පරමල්, ආදරණීය පාසල, තුරු සෙවණ හා තණ පඳුර, නංගිගේ රහසිගත සෙනෙහෙ වීණාව, සතුට

03. පේමතෝ ජායතී සෝකෝ නාට්‍යය - රසවින්දනය හා විචාරය (තෙවන අංකය)

04. පුරාතන ගද්‍ය අර්ථාවබෝධය හා රසවින්දනය (කුණ්ඩලකේසීගේ වස්තුව ජීවක වෛද්‍යවරයාගේ කතාව)

05. බැද්දේගම (නවකතාව) - රසවින්දනය හා විචාරය (6-10 පරිච්ඡේද)

06. කෙටිකතා - රසවින්දනය හා විචාරය
- කවියෙකුට අත්දැකීමක් - රංජිත් ධර්මකීර්ති
- ගස් - නිශ්ශංක විජේමාන්න
- හැත්තෑ ලක්ෂයෙන් එකෙක් - ලියනගේ අමරකීර්ති
- නිදහස් උදෑසන - කීර්ති වැලිසරගේ

07. කාරක භේදය
(ක්‍රියාකාරකම් පද සම්බන්ධය)
- කර්තෘ කාරක
- කර්ම කාරක
- භාව කාරක

08. සාරාංශකරණය

09. තීරු ලිපි රචනය

10. භාෂණ ව්‍යවහාරය ලේඛන ව්‍යවහාරයට හැරවීම

03 වාරය

01. ගුත්තිල කාව්‍ය (260 - 317 කවි)

02. නූතන කාව්‍ය අභ්‍යාසකරණය

03. නාට්‍ය අභ්‍යාසකරණය

04. පුරාතන ගද්‍ය සාහිත්‍යයෙන් ප්‍රකට වන මානව ගුණධර්ම

05. බැද්දේගම (නවකතාව) - සමාලෝචනය

06. කෙටිකතා අභ්‍යාසකරණය

07. ප්‍රකෘති කථනය, විකෘති කථනය හා වාක්‍ය රීති පිළිබඳ අභ්‍යාස

08. වාක්‍ය රචනය

09. ශාස්ත්‍රීය ලිපි සම්පාදනය

10. සාරාංශකරණය (අභ්‍යාස)

❖ **සැ. යු - විභාග ආකෘති ප්‍රශ්නපත්‍ර පිළිබඳ ඉදිරි නිබන්ධනයකින් ඔබව දැනුවත් කරනු ලැබේ.**